සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>Grade 11 | බුද්ධ ධර්මය - I | පැය එකයි<br>One hour |

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

01 සිදුහත් කුමරුගේ පියාගේ එකම අභිලාෂය වූයේ තම පුත්‍රයා
(i) බුද්ධත්වයට පත්වනු දැකීම ය. (ii) දේවත්වයට පත්වනු දැකීම ය.
(iii) සක්විති රජ කෙනෙකු බවට පත්වනු දැකීම ය. (iv) බ්‍රහ්මත්වයට පත්වනු දැකීමය.

02 සිදුහත් කුමරු ජයගත් අභියෝගයකට උදාහරණයක් නොවන්නේ,
(i) උපන් විගස පියවර තැබීම.
(ii) ඥාතීන් ඉදිරියේ ශිල්ප දැක්වීම.
(iii) දෙපාර්ශවයේ ආශිර්වාද මැද විවාහ මංගල්‍යය සිදුකිරීම.
(iv) පස්කම් සුව අත්හැරීම.

03 "අනේක ජාති සංසාරං - සන්ධා විස්සං අනිබ්බිසං" යන පාඨය හඳුන්වන්නේ,
(i) නිබ්බුත පද යනුවෙනි. (ii) පළමු උදානය යනුවෙනි.
(iii) අභීත සිංහ නාදය යනුවෙනි. (iv) අවසාන බුද්ධ වචනය යනුවෙනි.

04 පස්වග තවුසන් බුදුරජාණන් වහන්සේගෙන් ධර්මය ඇසීමට පෙළඹ වූයේ බුදුරජාණන් වහන්සේ තුළ පැවැති
(i) සත්‍ය වචනයේ බලය හා විමසුම්ශීලී වීමය.
(ii) පෙර පැවැති හිතවත්කමය.
(iii) උසස් යැයි සම්මත කුලයක උපන් නිසාය.
(iv) ඍද්ධි ප්‍රාතිහාර්ය පෑමේ හැකියාව නිසාය.

05 බුදුරජාණන් වහන්සේ තනතුරු ප්‍රදානය කිරීමේ දී අනුගමනය කළේ,
(i) ගෝත්‍රය, කුලය, නිලය යනාදිය පිළිබඳ සොයාබැලීමය.
(ii) තමාට දක්වන හිතවත්කම, පක්ෂපාතීත්වය පිළිබඳව ය.
(iii) තනතුරුලාභියා සතුව පවතින කුසලතාව පිළිබඳව ය.
(iv) තනතුරුලාභියා කරන ආයාචනය පිළිබඳව ය.

06 බොදු දරුවකුගේ පෞරුෂය සතු සුවිශේෂී ලක්ෂණය වන්නේ,
(i) අභියෝග හමුවේ බියෙන් පලායාමය. (ii) කිසිදු අරමුණක් නැතිව කටයුතු කිරීමය.
(iii) බාධක හමුවේ උකටලීව කටයුතු කිරීමය. (iv) අභියෝග ජයගෙන ඉදිරියට යාමය.

07 චීවර, පිණ්ඩපාත, සේනාසන හා ගිලන්පස යනු
(i) සිව් බඹ විහරණය (ii) සිව්පසය
(iii) සතර සෘද්ධිපාදයන්ය (iv) සතර අගතිය

08 බුදුරජාණන් වහන්සේ පිප්ඵලී ගුහාවට වැඩමකොට සත්ත බොජ්ඣංගය දේශනා කළේ,
(i) මුගලන් මහරහතන් වහන්සේට ය. (ii) ආනන්ද හිමියන්ට ය.
(iii) මහා කාශ්‍යප මහරහතන් වහන්සේට ය. (iv) පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේට ය.

09 බුදුරජාණන් වහන්සේ සුනීත, සෝපාක, ආලවක කුමරු යනාදී අයට පිහිට වීම තුළින් පෙන්නුම් කළේ,
(i) තාදී ගුණයයි. (ii) පුරිසදම්ම සාරථී ගුණයයි.
(iii) අසරණ සරණ ගුණයයි. (iv) ගිලානෝපස්ථාන ගුණයයි.

10 පාසලේ පන්තියේ හා වෙනයම් සමාජයකදී අපට හමුවන නොහික්මුණු පුද්ගලයන් යහමගට ගැනීමට කළ යුත්තේ,
(i) සැර පරුෂ වචනින් බැණ වැදීම.
(ii) දඩු මුගුරු, ආවි ආයුධ වලින් පහර දීම.
(iii) නින්දා අපහාස කිරීම.
(iv) කාරුණික වදනින් කථාකොට ඔහුගේ ගැටලුවලට විසඳුම් දීම.

11 පාරමිතා ගුණ ධර්ම පුහුණු කරන්නෙක් ඒවා කරුණු පහකින් සම්පූර්ණ කරයි. ඉන් තුනක් අත්හැරීමට අයත්වන අතර කරුණු 2 ක් ජීවිතයට එක්කර ගැනීමට අයත්වේ. එම කරුණුවලට අදාළ නොවන්නේ,
(i) තන්හාවෙන් යුතුව දාන සීලාදී ගුණ ධර්ම පිරීම.
(ii) මානයෙන් තොරව එම ගුණ ධර්ම පිරීම.
(iii) කරුණාවෙන් යුක්තව දාන සීලාදී ගුණ ධර්ම පිරීම.
(iv) මිත්‍යාදෘෂ්ටියෙන් තොරව එම ගුණ ධර්ම පිරීම.

12 දාන පාරමී හා දාන උප පාරමී යන දෙකට අදාළ කරගත හැකි ජාතක කථා දෙක පිළිවෙලින්
(i) සිවි ජාතකය හා සස ජාතකයයි. (ii) සස ජාතකය හා සිවි ජාතකයයි.
(iii) වෙස්සන්තර ජාතකය හා සස ජාතකයයි. (iv) වෙස්සන්තර ජාතකය හා සිවි ජාතකයයි.

13 ඇස, කන, නාසය, දිව හා ශරීරය යනු
(i) පංච ඉන්ද්‍රියන් ය. (ii) පංච බලයන් ය.
(iii) පස්මරුන් ය. (iv) පංච විලෝකනයන් ය.

14 ප්‍රබුද්ධ ජීවිතය යනු
(i) අලසකමින්, උදාසීන කමින් හා අසහනයෙන් පිරුණු ජීවිතයයි.
(ii) වෛරයෙන්, ක්‍රෝධයෙන්, ගුණමකුකමින් පිරුණු ජීවිතයයි.
(iii) අලසකමින්, උදාසීනකමින් හා අසහනයෙන් තොර ජීවිතයයි.
(iv) සුරාවෙන්, සූදුවෙන්, රැවටීමෙන් යුත් ජීවිතයයි.

15 නිරෝගී, නිවැරදි, දක්ෂ යන වචනවලට සමාන අදහස ඇති වචනය වන්නේ,
(i) සාවද්‍යය යන්නය (ii) කුසල් යන්නය (iii) අනලස් යන්නය (iv) අකුසල් යන්නය

16 සාමඤ්ඤඵල සූත්‍රය අනුව වනයක අතරමංවූවකු ලෙස උපමා කර ඇති නීවරණය වන්නේ,
(i) ව්‍යාපාද නීවරණය (ii) ථිනමිද්ද නීවරණය
(iii) උද්ධච්ච කුක්කුච්ච නීවරණය (iv) විචිකිච්ඡා නීවරණය

17 හොරණ ප්‍රදේශයේ කළුපහන නම් කන්දේ ගල් ගුහාවක වැඩ වසමින් ශ්‍රී ලාංකිකයන්ට බුදු දහමේ අගය වටහා දුන් හිමිපාණන් වහන්සේ වන්නේ,
(i) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි (ii) යූ. විනයාලංකාර හිමි
(iii) මේරුකාතේ චන්ද විමල මහ නාහිමි (iv) බුද්ධ පුත්‍ර හිමි

18 සමාජයේ බොහෝ දෙනා අතර ඇති ප්‍රශ්න සියයකට පිළිතුරු සැපයෙන රේරුකානේ චන්ද විමල මහ නාහිමි විසින් රචනා කළ ධර්ම ග්‍රන්ථය වන්නේ,

(i) පාරමිතා ප්‍රකරණය (ii) පොහොය දිනය
(iii) ධර්ම විනිශ්චය (iv) බෞද්ධයාගේ අත්පොත

19 තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතාම පහසුය .... යන අදහස දැක්වෙන ධම්ම පද ගාථාවේ මුල් පද පෙළ වන්නේ,

(i) අචරිත්වා බ්‍රහ්ම චරියං යන්නය (ii) සුකරානි අසාධූනි
(iii) උට්ඨානවතෝ සතිමතෝ යන්නය (iv) තංච කම්මං කතං සාධු යන්නය

20 කාලා රස මුසු බෝජන කෙර පෙම්....... යන කවිය ඇත්තේ,

(i) වීදාගම මෛත්‍රී හිමිපාණන් ලියූ ලෝවැඩ සඟරාවේ ය.
(ii) වැත්තැවේ හිමිපාණන් ලියූ ගුත්තිල කාව්‍යයේ ය.
(iii) තොටගමුවේ ශ්‍රී රාහුල හිමිපාණන් ලියූ කාව්‍ය ශේඛරයේ ය.
(iv) අසරණ සරණ සරණංකර හිමිපාණන් ලියූ මුණිගුණාලංකාරයේ ය.

21 බුදු දහම පරලොව දියුණුවම ඉලක්ක කරගත් කරුණු පිළිබඳව පමණක් ඉගැන්වෙන දහමකි. මෙම අදහස

(i) සත්‍ය වේ.
(ii) බුදු දහම පිළිබඳ අල්පමාත්‍ර දැනුමින් යුක්ත වූවෝ පවසති.
(iii) පිළිගත හැකි එකකි.
(iv) පැරණි මතයකි.

22 ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ සඳහන් වන ධනය විනාශ වී යා හැකි ක්‍රම හතරට අයත් නොවන්නේ,

(i) රජයට අයත්වීම. (ii) සොරුන් විසින් පැහැර ගැනීම.
(iii) ගින්නෙන්, ජලයෙන් විනාශ වීම. (iv) තමා ප්‍රිය කරන අයට අයත් වීම.

23 මහා මංගල සූත්‍රයේ පුද්ගලයාගේ දියුණුවට අදාළ කරුණු ගණන වන්නේ,

(i) 37 කි. (ii) 38 කි. (iii) 40 කි. (iv) 39 කි.

24 අති පූජ්‍ය රේරුකානේ මහ නාහිමියන් ග්‍රන්ථ රචනා කිරීම හා අදාළ වන්නේ,

(i) තමා ලියූ ගද්‍ය නැවත කපා හැර වැරදි හැදීම.
(ii) ථේරවාදී පිළිගැනීම්වලට එකඟ නොවන ග්‍රන්ථ රචනා කිරීම.
(iii) ලියනදේ එක වතාවෙන්ම ලියා මුද්‍රණයට යැවීම.
(iv) ත්‍රිපිටකයේ සඳහන් කරුණු වෙනස් කරමින් පොත් ලිවීම.

25 සසර දුකින් මිදීමට බුදුරජාණන් වහන්සේ වදාළ මාර්ගයට පිවිසීමේ දොරටුව වන්නේ,

(i) ශ්‍රද්ධාව (ii) සීලය (iii) සමාදානය (iv) සමගිය

26 චතුරශ්‍රාකාර ස්තූපයක් වශයෙන් මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතා පෙන්වා දුන්නේ,

(i) දැදිගම කොටවෙහෙර (ii) මහියංගණ ස්තූපය
(iii) පොළොන්නරුවේ සත්මහල් ප්‍රාසාදය (iv) කතරගම කිරිවෙහෙර

27 කණිෂ්ක ධර්ම සංගායනාවට සහභාගි වූ සියලුම භික්ෂූන් වහන්සේලා හැඳින්වූයේ,

(i) රහතන්වහන්සේලා යනුවෙනි. (ii) පසේ බුදුවරුන් යනුවෙනි.
(iii) බෝධිසත්වවරුන් යනුවෙනි. (iv) යෝගාවචරයන් වහන්සේලා යනුවෙනි.

28 ලංකාවේ පැරණිම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති වශයෙන් සැලකෙන්නේ,

(i) හෙළ අටුවාය (ii) වංශ කතාය (iii) ටීකාය (iv) පරිකතාය

29 ආත්ම, අත්ත යන්නෙහි සිංහල යෙදුම වන්නේ,

(i) "අපි" යන්නය (ii) "මම" යන්නය (iii) "නුඹ" යන්නය (iv) "දුක" යන්නය

30. අනිච්චාවත සංඛාරා - උප්පාද වයධම්මිනෝ.... යන්නෙහි අදහස වන්නේ,

(i) ක්‍රෝධය උපන්විට වෛරය උපදී - ක්‍රෝධය නිවී ගිය විට වෛරය සංසිඳෙයි.

(ii) යම්සේ මුල් නිරුපද්‍රිතව තිබියදී කපන ලද ගස නැවත නැවත ලියලයි.

(iii) අපි වෛර කරන්නවුන් අතර අවෛරීව සුවසේ වාසය කරමු.

(iv) ඇතිවී නැතිව යන බැවින් සංස්කාර ඒකාන්ත වශයෙන්ම අනිත්‍යය.

31 පුබ්බාචරිය, පුබ්බදේව, බ්‍රහ්ම යන විශේෂණ පදවලින් හැඳින්වෙන්නේ,

(i) දෙමාපියන්ය. (ii) ගුරුවරුන්ය. (iii) මිතුරන්ය. (iv) දෙවියන්ය.

32 බෞද්ධ ගිහි සමාජයට අයත් පිරිස වන්නේ,

(i) භික්ෂූන් වහන්සේලා හා භික්ෂුණියන් වහන්සේලා ය.

(ii) උපාසකයන් හා උපාසිකාවන් ය.

(iii) දායකයන් හා දායිකාවන් ය.

(iv) ගිහියන් හා පැවිදි පක්‍ෂයයි.

33 දැඩි චේතනාවක් නොමැතිව සිදුවන අසම්පූර්ණ කුසලාකුසලකර්ම හඳුන්වන්නේ,

(i) ගරුක කර්ම යනුවෙනි. (ii) ආසන්න කර්ම යනුවෙනි.

(iii) ආචිණ්ණ කර්ම යනුවෙනි. (iv) කටත්තා කර්ම යනුවෙනි.

34 බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය ආශ්‍රිතව වස් විසූ ස්ථානයක් ලෙස සැලකිය නොහැක්කේ,

(i) බරණැස ඉසිපතනය (ii) රජගහනුවර වේළුවනාරාමය

(iii) රජගහනුවර සීත වනය (iv) සප්තපර්ණී ගුහා ද්වාරය

35 බුදුරජාණන් වහන්සේ වැඩවිසූ කුටිය හඳුන්වා ඇත්තේ,

(i) පාසාදය යනුවෙනි. (ii) ගන්ධකුටිය යනුවෙනි.

(iii) ගෙඩිගේ යනුවෙනි. (iv) පටිමාඝර යනුවෙනි.

36 පොළොන්නරු යුගයේ විශාලතම චිත්‍රාවලිය දැකිය හැකි වන්නේ,

(i) සීගිරියේ ය (ii) තිවංකපිළිමගෙහිය (iii) හිඳගලය (iv) කැලණියේය

37 දානඤ්ච ධම්ම චරියාච..... යන කරුණු ඇතුළත් වන්නේ,

(i) මහා මංගල සූත්‍රයේ ය. (ii) පරාභව සූත්‍රයේ ය.

(iii) කරණීයමෙත්ත සූත්‍රයේ ය. (iv) වසල සූත්‍රයේ ය.

38 රාජ්‍ය පාලකයා විසින් රටවැසියාගේ ආර්ථික සුරක්ෂිතතාව තහවුරු කරලීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය ලබාදීම

(i) දානය නම් වේ. (ii) පරිත්‍යාගය නම් වේ.

(iii) සීලය නම් වේ. (iv) තපස නම් වේ.

39 ගර්භයේ හැඩය නෙල්ලි ගෙඩියක ස්වරූපයෙන් ගොඩනංවන ලද ස්තූප හැඳින්වෙන්නේ,

(i) ධාන්‍යාකාර ස්තූප ලෙසයි. (ii) ඝටාකාර ස්තූප ලෙසයි.

(iii) ආම්ලාකාර ස්තූප ලෙසයි. (iv) පද්මාකාර ස්තූප ලෙසයි.

40 අප මහ බෝසතාණන් වහන්සේ මහා කපි හා මඝ මානවක කතාවන් තුළින් පුරන ලද පාරමිතාව

(i) මෛත්‍රී පාරමිතාවය (ii) දාන පාරමිතාව

(iii) සීල පාරමිතාවය (iv) උපේක්ෂා පාරමිතාවය

(ලකුණු 1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Department of Education, Southern Province

## පළමු වාර පරීක්ෂණය 2019 මාර්තු
## First Term Test, March 2019

| | | |
|---|---|---|
| 11 ශ්‍රේණිය<br>Grade 11 | බුද්ධ ධර්මය - II | පැය දෙකයි<br>Two hours |

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 2 බැගින් ලකුණු 20 ක් ද, අංක 02 සිට 06 දක්වා ප්‍රශ්නයක (i) කොටසට ලකුණු 2 ක් ද, (ii) කොටසට ලකුණු 03 ක් ද, (iii) කොටසට ලකුණු 5 ක් ද වශයෙන් මුළු ලකුණු 10 ක් හිමිවේ. 07 වන ප්‍රශ්නයේ එක් කොටසකට ලකුණු 5 කි.

---

(01) i. යසෝදරා දේවියට පුතකු ලද බව බෝසතුනට දැනගන්නට ලැබුණු අවස්ථාවේ බෝසත් කුමරුගේ මුවින් පිටවූ වාක්‍ය ලියන්න.

ii. මාර දූවරු තිදෙනා නම් කරන්න.

iii. බුදු දහමෙහි ඉගැන්වෙන භාවනාවෙහි පරමාර්ථය කුමක් ද?

iv. බුදු සසුනේ අගසව් දෙනම නම් කරන්න.

v. අවෙච්චප්පසාදය යන්න හඳුන්වන්න.

vi. අනුරාධපුර සඳකඩ පහණෙහි දක්නට ලැබෙන එකිනෙකා පසුපස දිවයන සතුන් නම් කරන්න.

vii. ''පෙදෙන් බුදු සිරිතැ - බසින් වත් සිරිත් ඇ'' යනුවෙන් කෘතිය ආරම්භයේදීම සඳහන් වන සාහිත්‍ය ග්‍රන්ථය කුමක් ද?

viii. ප්‍රඥාව දියුණු කරගන්නා ක්‍රම තුනෙන් දෙකක් නම් කරන්න.

ix. චතු අප්පමඤ්ඤා නම් කරන්න.

x. ''කල්‍යාණ මිත්තතා'' කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 2 x 10 = 20)

(02) i. පාසල් සිසුන් වන ඔබගේ ඉදිරි දියුණුව අවහිර වන මාර බලවේග ලෙස හඳුනාගත හැකි කරුණු දෙකක් නම් කරන්න. (ල. 02)

ii. ඔබ ඉහත සඳහන් කළ කරුණක් දියුණුව අවහිර කරන මාර බලවේගයක් වන ආකාරය පැහැදිලි කරන්න. (ල. 03)

iii. පාසල් සිසුන් වශයෙන් ඔබට මුහුණ දීමට සිදුවන අභියෝග ජයගන්නා ආකාරය විස්තර කරන්න. (ල. 05)

(03) i. අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. ...... යනාදි වශයෙන් නැවත නැවත සිතමින් වෛරය නොසන්සිඳෙන ආකාරය පෙන්වාදී ඇති ධම්ම පද ගාථාව ලියන්න. (ල. 02)

ii. එම ගාථාවේ තේරුම ලියන්න. (ල. 03)

iii. ධම්ම පදය උපදේශාත්මක ග්‍රන්ථයක් වශයෙන් වැදගත්වන ආකාරය විස්තර කරන්න. (ල. 05)

(04) i. දානං සීලංච නෙක්ඛම්මං ..... ගාථාව සම්පූර්ණ කරන්න. (ල. 02)

ii. එම ගාථාවේ සඳහන් වන පාරමිතා ධර්ම 3 ක් ලියන්න. (ල. 03)

iii. වීර්ය පාරමිතාව හඳුන්වා එය සමාජගත ජීවිතය සාර්ථක කර ගැනීමට යොදාගතහැකි ආකාරය විස්තර කරන්න. (ල. 05)

(05) i. සීල ශික්ෂාවට අයත් අංග නම් කරන්න. (ල. 02)

ii. කායික සීලය හඳුන්වන්න. (ල. 03)

iii. පන්සිල් ආරක්ෂා කිරීම නිසා තහවුරු වන මානව අයිතිවාසිකම් කවරේදැයි විස්තර කරන්න. (ල. 05)

06) i. බුද්ධ දේශනාව අනුව රස ගුණ ඇති මැනවින් සැකසූ ආහාර ගැනීම තුළින් සම්පත් පහක් ලැබෙන බව දක්වයි. එම සම්පත්වලින් 2 ක් ලියන්න. (ල. 02)

ii. ආහාරපාන ගැනීම පිළිබඳව දෝණපාක සූත්‍රයේ සඳහන් කරුණු මොනවා ද? (ල. 03)

iii. නිවැරදි ආහාර රටාවක් අනුගමනය කිරීම පුද්ගලයාගේ ශරීර සෞඛ්‍යයට හේතුවන ආකාරය විස්තර කරන්න. (ල. 05)

(07) පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

i. ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා

ii. කොරවක්ගල

iii. කව්සිළුමිණ

iv. විදර්ශනා භාවනාව (ලකුණු 5 x 2 = 10)

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව — පළමු වාර පරීක්ෂණය 2019

11 ශ්‍රේණිය — බුද්ධ ධර්මය

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(iii) | 2 -(i) | 3 -(ii) | 4 -(i) | 5 -(iii) | 6 -(iv) | 7 -(ii) | 8 -(iii) | 9 -(iii) | 10 -(iv) |
| 11-(i) | 12 -(iv) | 13 -(i) | 14 -(iii) | 15 -(ii) | 16 -(iv) | 17 -(ii) | 18 -(iii) | 19 -(ii) | 20 -(i) |
| 21-(ii) | 22 -(iv) | 23 -(ii) | 24 -(iii) | 25 -(i) | 26 -(iii) | 27 -(iii) | 28 -(i) | 29 -(ii) | 30 -(iv) |
| 31-(i) | 32 -(ii) | 33 -(iv) | 34 -(iv) | 35 -(ii) | 36 -(ii) | 37 -(i) | 38 -(i) | 39 -(iii) | 40 -(i) |

## II කොටස

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

(01) i. රාහුලෝ ජාතෝ බන්ධනං ජාතං හෝ (රාහුලයෙක් උපන්නා බැම්මක් ඇතිවුණා)
ii. තණ්හා, අරතී (රති), රගා
iii. යහපත් අරමුණක හෙවත් කුසල් අරමුණක සිත එකග කර ගැනීම
iv. සැරියුත් හිමි / මුගලන් හිමි
v. ත්‍රිවිධ රත්නය පිළිබඳව කරුණු දැන ඇතිකරගන්නා පැහැදීම අවෙච්චප්පසාදයයි.
vi. ඇත්, අස්, සිංහ, ගව
vii. සියබස්ලකර
viii. සිතීම (චින්තාමය ප්‍රඥා), පොතපත කියවීම, සවන්දීම (සුතමය ප්‍රඥා), භාවනා කිරීම (භාවනාමය ප්‍රඥා)
ix. මෙත්තා, කරුණා, මුදිතා, උපෙක්ෂා
x. යහපත් මිතුරන් ඇසුරු කිරීම මෙහි අදහසය. මෙවැනි මිතුරන් තුළ ශ්‍රද්ධා, සීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණාංග ඇත. එම ගුණ ධර්ම තමාගේ ජීවිතයට ළංකරගත හැකි බැවින් කල්‍යාණ මිත්‍ර ආශ්‍රය පුද්ගල ජීවිතය සාර්ථක කරයි. (2 x 10 = 20)

(02) i. තරුණ මදය, කුසගින්න, කුසීතකම, දඩබ්බර ගතිය, ප්‍රචණ්ඩ සිතුවිලි, ඊර්ෂයාව, පළිගැනීම, කාමුක සිතුවිලි හෝ වෙනත් ගැළපෙන පිළිතුරු (ල. 02)
ii. අදාළ කරුණ හඳුන්වා එය තමාගේ දියුණුවට බාධා කරන ආකාරය කෙටියෙන් හඳුන්වා ඇති උචිත පිළිතුරු සඳහා ප්‍රමාණවත් ලකුණු දෙන්න. (ල. 03)
iii. පාසල් සිසුන් වශයෙන් මුහුණදීමට සිදුවන අභියෝග 3 ක් නම්කර එය ජයගන්නා ආකාරය බුද්ධ චරිතයේ අවස්ථාවන් ද ගලපා ලියා ඇති පිළිතුරුවලට උපරිම ලකුණු දෙන්න. බුදු සිරිත පදනම් නොකර ලියා ඇත්නම් ලකුණු 03 කි. (ල. 05)

(03) i. අක්කොච්ඡි මං අවධි මං
අජිනි මං අහාසි මේ
යේ තං උපනයිහන්ති
වේරං තේසං න සම්මති (ල. 02)
ii. අසවලා මට බැන්නේය. මට පහර දුන්නේය. මා පැරදවූයේ ය. මා සතු දේ පැහැර ගත්තේය. යනුවෙන් යම් අය නැවත නැවත සිතමින් වෛර බඳිත් නම් ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ (ල. 03)
iii. සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට අයත් ධම්ම පදය වග්ග 26 න් ද, ගාථා 423 ක් ද නිදාන කතා 299 ක් ද සමන්විත ග්‍රන්ථයකි. මෙය බෞද්ධයාගේ අත්පොත වශයෙන් හඳුන්වයි. ත්‍රිපිටකයේ අඩංගු ධර්ම කරුණුවල සම්පිණ්ඩනයක් ලෙස මෙම ග්‍රන්ථය සැලකිය හැකිය. මෙහි අඩංගු දහම් කරුණු කාල, දේශ සීමා, ජාති, ආගම් ආදී කිසිදු භේදයකින් තොරව පරිහරණය කළ හැකි වටිනාකමකින් යුක්ත වේ.
සෑම ගාථාවකින්ම උපදේශයක් ලබාදී පුද්ගල ජීවිතය යහපතට, දියුණුවට යොමුකිරීමට උත්සාහ ගෙන ඇත. මෙම කරුණුවලට අමතරව අඩුම තරමින් ගාථා 3 ක් ලියා ඉන් ලබාදෙන උපදේශයන් හඳුන්වා දී ඇති පිළිතුරු සඳහා උපරිම ලකුණු දෙන්න. ගාථා හා උපදේශ අඩුනම් අඩු ලකුණු දෙන්න. (ල. 05)

(04) i. දානං සීලංච නෙක්ඛම්මං
පඤ්ඤා වීරියේන පංචමං
ඛන්ති සච්චමධිට්ඨානං
මෙත්තු පෙක්ඛාතිමේ දස (ල. 02)
ii. දානය, සීලය, නෙක්ඛම්ම, පඤ්ඤාව, වීර්ය, ක්ෂාන්තිය (ඉවසීම), සත්‍යය, අධිෂ්ඨානය, මෛත්‍රිය, උපේක්ෂාව (ල. 03)
iii. වීර්ය යනු උතුම් බලාපොරොත්තුවක් ඉටුවනතුරු නොපසුබට උත්සාහයෙන් කටයුතු කිරීමය. තණ්හාවෙන්, මානයෙන්, මිත්‍යාදෘෂ්ටියෙන් තොරව කරුණාවෙන් හා ප්‍රඥාවෙන් යුතුව තමන්ගේත් අනුන්ගේත් අභිවෘද්ධිය පිණිස කටයුතු කිරීමට ගන්නා බලවත් උත්සාහය වීර්ය පාරමිතා නම් වේ.
යම් කාර්යයක් ඉටුකරගැනීමේදී ඇතිකරගතයුතු වීර්යය (ආරම්භක ධාතු) ඉදිරිපත්වීමේ වීර්යය (නික්කම ධාතු) නිරතවීමේදී ඇතිකරගතයුතු වීර්යය (පරක්කම ධාතු) යන පියවර තුනේදීම නොපසුබටව ක්‍රියා කළ යුතු වීම වීර්යයේදී තිබිය යුතුය.
සමාජ ජීවිතය සාර්ථක කර ගැනීමට මෙම පාරමිතාව බොහෝ උපකාරීවේ. යම් කාර්යයක් සාර්ථක කර ගැනීමට නොපසුබට උත්සාහයෙන් වීර්යයෙන් කටයුතු කිරීමට සිදුවේ. මෙහිදී යමක් ආරම්භ කිරීමේදී. ඉදිරිපත්වීමේදී හා නිරතවීමේදී යන අවස්ථා තුනකදී වීර්යයෙන් ක්‍රියා කළ යුතු බව සඳහන් වේ. තරග විභාග, ක්‍රීඩා තරග ආදිය ජය ගැනීමට ද ජීවිත අභියෝග ජය ගැනීමට ද මනා වීර්යයක් අවශ්‍ය වේ. සමාජ ගෞරවය ලැබීම කුසලතා සම්මාන පදක්කම් ආදී දේ හිමිවීමට ද වීර්යය අත්‍යවශ්‍ය සාධකයකි. (ල. 05)

(ල. 02)

(05) i. සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව

ii. ප්‍රාණඝාතයෙන්, කාමමිථ්‍යාචාරයෙන් හා සොරකමින් වැළකී සියලු සතුන්ට කරුණාව මෛත්‍රිය දක්වීම, දූන්දේ ගැනීම, විරුද්ධ ලිංගිකයන් සමග ශිෂ්ඨසම්පන්න හැසිරීම් රටා ඇතිව ක්‍රියා කිරීම කායික සීලය වේ. (ල. 03)

iii. පංච සීලය ගිහියාගේ නිත්‍ය ශීලයයි. මෙයට සිල්පද පහක් අයත්වේ. ඒවායින් පළමුවැන්න ආරක්ෂා කිරීම නිසා ජීවත්වීමේ අයිතිය නමැති මූලික අයිතිවාසිකම ආරක්ෂා වේ. එම සිල්පදය නිසා පුද්ගලයන් හිංසාවට, පීඩාවට පත්නොවේ. ජීවිතාරක්ෂාව පිළිබඳ සහතිකයක් ලබාදෙයි. පළමු සිල්පදය ආරක්ෂා කිරීම නිසා මිනිස් ජීවිතයේ සුරක්ෂිත බව ආරක්ෂාවේ.

එසේම දෙවැන්න ආරක්ෂා කිරීම නිසා පෞද්ගලික දේපල ආරක්ෂා වේ. පෞද්ගලික දේපළ තබාගැනීමද, මානව අයිතියකි. වෙනත් අයෙකුගේ දේපල සොරකම් කිරීමට, මංකොල්ල කෑමට , තවත් අයෙකුට හිමිකමක් නැත. එසේ නොකරන විට හැම දෙනාගේම දේපල ආරක්ෂා වේ.

පංචශීලයෙහි තෙවන ශික්ෂා පදය රකින විට පවුල් ජීවිතයේ නිදහස ආරක්ෂාවේ. එසේම සිව්වන සිල්පදය ආරක්ෂා කරන විට තමන් රැවටීමෙන් තොරව අන්‍යෝන්‍ය විශ්වාසයෙන් ජීවත් වීමේ අයිතිය ආරක්ෂා වේ. එම සමාජය සත්‍යවාදී එකක් බවට පත්වේ.

පස්වන ශික්ෂා පදය ආරක්ෂා කිරීම නිසා මනා සිහි නුවණ ඇත්තන්ගෙන් යුත් සමාජයක් බිහිවේ. එසේ නොකරන විට මනස විකෘත වී තමාගේ ජීවිතයටම හානි සිදුකරගන්නා පුද්ගලයන් බිහිවී වෙනත් දුරාචාරයන්ට ද යොමුවී අන් අයගේ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට පවා කටයුතු කරනු ඇත. ගිහියාගේ නිත්‍ය ශීලය වන පන්සිල් සුරැකීම නිසා මිනිස් අයිතිවාසිකම් ආරක්ෂාවන බව ඉහත කරුණු අනුව පෙන්වා දිය හැකිය. (ල. 05)

(ල. 02)

(06) i. ආයුෂ, වර්ණය, සැපය, බලය, ප්‍රඥාව

ii. හැමකල්හිම මනා සිහියෙන් යුතුව පමණ දන ආහාර ගන්නා මිනිසුන්ගේ දුක් වේදනා තුනීවීම / සීමාව, ප්‍රමාණ දන ආහාර වැළඳ විට ආහාර සෙමෙන් දිරීම ආයුෂ වැඩීම (ල. 03)

iii.
- * සියලු සත්ත්වයෝ ආහාරයෙන් ජීවත් වන නිසා ආහාර පාන නොගෙන කිසිවෙකුට ජීවත් විය නොහැක. ආහාරපාන ගැනීමේදී සැලකිය යුතු කරුණු පිළිබඳව බුදු දහමේ එන දෝණපාක සූත්‍රයේ සඳහන්ව ඇත. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ආහාර පරිභෝග කළ හැක්කේ සිහි නුවණින් බව පෙන්වාදී ඇත්තේ දන් වැළඳීමට පෙර කරන ප්‍රත්‍යවේක්ෂාව මගිනි.
- * අවිධිමත් ලෙස ආහාර ගන්නා අය පස්දෙනෙකු පිළිබඳව පෙන්වා දී ඇත්තේ නිවැරදි පරිභෝජන රටාවක් පෙන්වාදීම සඳහා ය.
- * ඕවාද ප්‍රාතිමෝක්ෂය අනුව ආහාරයේ පමණ නොදන්නා ගැනැත්තා දුර්වල ගසක් සුළඟින් ඇද වැටෙන්නා සේ මරු වසහයට ඇද වැටෙන බව ධම්ම පදයෙහි දක්වා ඇත.
- * ඉහත කරුණු හා යහපත් ආහාර රටාවක් සඳහා අනුගමනය කළ යුතු කරුණු ඇතුළත් පිළිතුරු සඳහා උපරිම ලකුණු දෙන්න. (ල. 05)

(07) i. <u>ශ්‍රීමත් අනගාරික ධර්මපාල තුමා</u>

19 වන සියවස මැද භාගය වන විට ලාංකිකයන් තුළ රට ජාතිය, ආගම පිළිබඳව තිබූ ආදරය, අභිමානය යටපත්ව තිබුණි. ක්‍රිස්තියානි ආගම වැළඳගත් අයට සමාජයේ උසස් තනතුරු නම්බුනාම හිමිවිය. බෞද්ධ යැයි කීමට සමහරු ලජ්ජා වූහ. හාමුදුරුවන් වහන්සේලාට දානය දීම දඩ ගැසීම වැනි වරදකට ලක්වීමට කරුණක් විය.

මෙවන් අවධියක ජාතිය හා බුද්ධ ශාසනය යළි නගාසිටුවීමේ අධිෂ්ඨානයෙන් වීර්යයන් සහිතව ජාතියේ පිනට 1864 සැප්. 17 දින දොන් කරෝලිස් හේවාවිතාරණ හා මල්ලිකා ගුණවර්ධන යන දෙමාපියන්ට දාව උපන් කුළුඳුල් දරුවාට තැබූ නම වූයේ දොන් ඩේවිඩ් හේවාවිතාරණ යන්නයි.

මෙම කරුණ හා එතුමාගෙන් ශ්‍රී ලංකීය ජාතියට, බුද්ධ ශාසනයට ඇතිවූ මෙහෙය පිළිබඳව ලියා ඇති පිළිතුරු සලකා බලා ලකුණු දෙන්න. (ල. 05)

ii. <u>කොරවක් ගල</u>

මුරගලට පිටුපසින් පිටගැටපෙළ දෙපස කැටයම් සහිතව හෝ රහිතව අත්වැලක් ලෙස දිගටිව ඇති ගල් පුවරුව කොරවක් ගලයි. මෙය පිටගැට පෙළ නඟින්නන්ගේ ආරක්ෂාව හා පිටගැටපෙළෙහි ආරක්ෂාව සඳහා ආධාරකයක් වශයෙන් ගොඩනැගුණ ද කලාත්මක නිර්මාණයකි.

මකර මුඛයකින් නිකුත්වන ලියවැලක් වෘත්තාකාර දඟරයකින් අවසන් වන ලෙස නිර්මාණය කර තිබීම මෙහි ඇති සුලභ කැටයම් වේ. සිංහ, හස්ති, නාග හෝ වාමන රූප කොරවක් ගලේ පිටට පෙනෙන බිත්තියේ කැටයමින් විසිතුරු කොට ඇත. (ල. 05)

iii. <u>කව්සිළුමිණ</u>

භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍යය කව්සිළුමිණයි. මෙහි කතුවරයා දඹදෙණියේ රජකළ දෙවන පරාක්‍රමබාහු රජතුමාය. කුස ජාතකය පදනම්ව මෙම කාව්‍යය රචනා කර ඇත. මෙහි සර්ග 15 ක් ද ගී 770 ක් ඇත. මෙය ශෘංගාර රසය දනවන ලෙස රචනා කර ඇත. (ල. 05)

iv. <u>විදර්ශනා භාවනාව</u>

බුදු දහමෙහි ප්‍රධාන භාවනා ක්‍රම දෙකක් ඇත. ඉන් එකක් වන්නේ විදර්ශනා භාවනාවය. විදර්ශනා යන්නෙහි අදහස වන්නේ විශේෂයෙන් දැකීම යන්නය. එසේත් නැත්නම් ඇත්ත ඇති සැටියෙන් දැකීමයි. විසේසේන පස්සතීති විපස්සනා'' යන්නෙහි එම අදහස ප්‍රකට කෙරේ. ත්‍රිලක්ෂණය මෙනෙහි කිරීමට උගන්වන බැවින් තිලකුණු භාවනාව ලෙසද සසර දුකින් මුදාලන ප්‍රඥාව ලබාදෙන බැවින් ප්‍රඥා භාවනාව ලෙසද හඳුන්වන මෙම භාවනාව මගින් කෙලෙස් මුලිනුපුටා දමන අතරම නිවන් සැප ලබාදීමට ද හේතුවන භාවනාවකි. (ල. 05)